# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1530/17 - 2008 ජනවාරි 01 වැනි අඟහරුවාදා - 2008.01.01

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

**2002 අංක 16 දරන හර බදු පනත**

13 වන වගන්තිය යටතේ නියෝගය

2002 අංක 16 දරන හර බදු පනතේ 13 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ඊ) ඡේදය මගින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම මෙම නියෝගය මගින් පහත සඳහන් ගිණුමකින් සිදු කරන හර කිරීම් හර බද්දෙන් නිදහස් විය යුතු බව නිශ්චය කරමි,

(1) මහජන බැංකුව, ලංකා බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව හෝ ග්‍රාමීය බැංකුවක, පාසල් සංවර්ධන සමිතියක් විසින් විවෘත කොට ඇති ජංගම හෝ ඉතිරි කිරීමේ ගිණුමකින්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වරයා විසින් පාසල් ළමයින්ගේ පෝෂණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා දෙනු ලබන මුදලක් සඳහා වන හර කිරීම්.

(2) "අපි වෙනුවෙන් අපි" අරමුදල මගින් කවර හෝ වාණිජ බැංකුවක, විශේෂිත බැංකුවක හෝ මූල්‍ය සමාගමක විවෘත කොට ඇති යම් ජංගම හෝ ඉතිරිකිරීම් ගිණුමකින් කරනු ලබන හර කිරීම්.

(3) 1972 අංක 05 දරන සමුපකාර සමිති නීතිය යටතේ ලියාපදිංචි වී ඇති කවර හෝ සමුපකාර සමිතියක් හෝ ග්‍රාමීය බැංකුවක් විසින් යම් වාණිජ බැංකුවක, විශේෂිත බැංකුවක හෝ මූල්‍ය සමාගමක විවෘත කොට ඇති යම් ජංගම හෝ ඉතිරිකිරීම් ගිණුමකින් කරනු ලබන සියළු හර කිරීම්.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
(මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය).

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ,
2008 ජනවාරි මස 01 වැනි දින.

01 –498